ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
පාර්ලිමේන්තුව

# 1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 16 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1998 අප්‍රේල් මස 17 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 5.75 තැපැල් ගාස්තුව : රු. 2.50

# 1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1998 අප්‍රේල් මස 16 වන දින]

එල්. ඩී.–ඕ. 56/96.

## මහරගම තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"මහරගම තරුණ බෞද්ධ සංගමය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සංගමයක් එකී සංගමයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව එකී සංගමයට සම්බන්ධ සියලු පරමාර්ථ සහ කාරණා එලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද ඒ පරමාර්ථ සහ කාරණා එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස ක්‍රියාත්මක කොට සහ ඉටුකර ඇති හෙයින් ද එකී සංගමය නීතිගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ එම ඉල්ලීම ඉෂ්ට කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 19 දරන මහරගම තරුණ බෞද්ධ සංගමය (සංස්ථාගත කිරීමේ) පනත වශයෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කරනු ලබන මහරගම තරුණ බෞද්ධ සංගමයේ දැනට සාමාජිකයන්ව සිටිනතාක් තැනැත්තන් සහ මෙයින් මතු සංස්ථාගත කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරගනු ලබන තැනැත්තන් මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවීමේ දින සිට සහ ඉන් පසුව "මහරගම තරුණ බෞද්ධ සංගමය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, එකී නාමයෙන් සහ අභිධානය යටතේ ඒ සංස්ථාව විසින් ද එයට විරුද්ධව ද සියලු අධිකරණවල නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබාගැනීමේ හා පාවිච්චි කිරීමේ ද තම අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. මහරගම තරුණ බෞද්ධ සංගමය සංස්ථාගත කිරීම.

2—D 040563—5,900 (96/06)

සංස්ථාවේ පොදු පරමාර්ථ.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ පහත සඳහන් පොදු පරමාර්ථ සඳහා බව මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :–

(අ) බුදු දහම ඉගෙනීමට සහ පැතිරවීමට පහසුකම් සැලැස්වීම ;

(ආ) බෞද්ධ සංස්කෘතිය සහ බෞද්ධ ජීවන මාර්ගය ප්‍රවර්ධනය කිරීම ;

(ඇ) බෞද්ධයින් අතර සමගිය සහ සහයෝගය ඇති කිරීම ;

(ඈ) සංගමයේ සාමාජිකයන්ගේ සමාජමය, ශාරීරික, සංස්කෘතික, සදාචාරාත්මක සහ ආධ්‍යාත්මික දියුණුව ප්‍රවර්ධනය කිරීම ;

(ඉ) බෞද්ධ කටයුතුවල යෙදීමට සාමාජිකයන් උනන්දු කරවීම ;

(ඊ) බෞද්ධයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා ප්‍රවර්ධනය පෝෂණය කිරීම ; සහ

(උ) සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය හෝ හිතකර වන්නා වූ වෙනත් සියලු දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

4. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ හා වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් භාර ගැනීමේ හා එකතු කිරීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය වන නිලධරයන් සහ සේවකයන් බඳවා ගැනීමේ, ඔවුන් සේවයේ නියුක්ත කරවීමේ සහ ඔවුන් සේවයෙන් නෙරපීමේ ද බලය ඇතුළුව සංස්ථාවේ පරමාර්ථ සියල්ල ම හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය සියලු ක්‍රියා හා දේ සිදු කිරීමේ, ඉටු කිරීමේ හා ක්‍රියාවේ යෙදවීමේ බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු, පරිපාලනය, සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන, සභාපතිවරයෙක්, උප සභාපතිවරු තිදෙනෙක්, ලේකම්, සහකාර ලේකම්, භාණ්ඩාගාරික, සහකාර භාණ්ඩාගාරික සහ තවත් සාමාජිකයන් විසි හතර දෙනකුගෙන් සමන්විත කළමනාකරණ මණ්ඩලයක් විසින් සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව පරිපාලනය කළ යුතු ය.

(2) මෙම පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දැරූ සංගමයේ කළමනාකරණ මණ්ඩලය සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය විය යුතු ය.

**6**. (1) සංස්ථාව විසින් කලින් කල යම් මහා සභා රැස්වීමක දී එයට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත දැක්වෙන සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනනුකූල නොවන පරිදි රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය :-

(අ) සාමාජිකයන් වර්ග කිරීම, සාමාජිකයන් බඳවා ගැනීම අත්හිටුවීම, ඉවත් කිරීම හෝ නෙරපීම :

(ආ) නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන් ධුරයෙන් ඉල්ලා අස්වීම, ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ඔවුන්ගේ බලතල, කාර්ය සහ චර්යාව :

(ඇ) කළමනාකරණ මණ්ඩලයේ සහ විධායක කමිටුවේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ බලතල, චර්යාව සහ කාර්ය:

(ඈ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය :

(ඉ) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීම් කැඳවීමේ දී, පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය, එම රැස්වීම් පැවැත්වෙන වේලාව, ස්ථානය, එම රැස්වීම්වල දැන්වීම් සහ න්‍යාය පත්‍රය, ගණපූරණය සහ එම රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම, සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු :

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, එහි අරමුදල්වල භාරය, භාර ගැනීම, නඩත්තු කිරීම, එහි ගිණුම් තැබීම සහ විගණනය කිරීම : සහ

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදන ලද යම් රීතියක් (1) වන උපවගන්තිය යටතේ යම් රීතියක් සාදනු ලැබූ ආකාරයෙන්ම, යම් රීතියක් සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සාමාජිකයන් සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, සංස්ථාව සඳහා සහ වෙනුවෙන් භාර ගනු ලබන හෝ මෙතෙක් භාර ගන්නා ලද ත්‍යාග, පරිත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, ප්‍රදාන, දායක මුදල් සහ ග්‍රාහක මුදල් වශයෙන් ලැබෙන සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ නාමට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී සංස්ථාව විසින් දරන ලද වියදම්, පියවීමට අවශ්‍ය සියලු මුදල්, සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සංගමය විසින් සහ සංගමයට ගෙවිය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයේ දී සංගමයේ පැවති සියලු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවා නිදහස් කළයුතු අතර, එදිනට සංගමයට ගෙවිය යුතු සියලු ණය සහ සාමාජික මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ තෙස්තමේන්තු නීයාදනයක් අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර නැතහොත් අන්‍යාකාරයකින් සංස්ථාව සතුවන යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කරගෙන දැරීමට නීතියෙහි ලා සංස්ථාවට හැකියාව ඇති අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත්කාලයෙහි බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්ය සඳහා සංස්ථාව විසින් දැරිය යුතු ය.

10. සංස්ථාවේ මුද්‍රාව, කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පුද්ගලයකු භාරයේ තබා ගත යුතු අතර, සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික ඉදිරිපිට දී මිස, සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. ඔවුන් ඉදිරිපිට දී මුද්‍රාව තැබූ බවට සලකුණක් වශයෙන් ඔවුන් විසින් තම නම අත්සන් කළ යුතු ය. එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය. සංස්ථාවේ මුද්‍රාව.

11. මේ පනතේ සඳහන් තැනැත්තන් සහ ඔවුන් වෙතින්, ඔවුන් මාර්ගයෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය. ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.